සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අවසාන වාර පරීක්ෂණය 2015

කෘෂි හා ආහාර තාක්ෂණය I

10 ශ්‍රේණිය **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකය:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 ශ්‍රී ලංකාවේ පළමු වෙනි බහු කාර්ය යෝජනා ක්‍රමය වන්නේ,

(1) වික්ටෝරියා යෝජනා ක්‍රමය (2) නිල්වලා යෝජනා ක්‍රමය
(3) ගල්ඔය යෝජනා ක්‍රමය (4) උඩවලවේ යෝජනා ක්‍රමය

02 ඈත අතීතයේ දී ශ්‍රී ලංකාවේ මිනිසුන් තම පැවැත්ම සඳහා අවශ්‍යතා සපුරාලීමට කෘෂිකර්මාන්තයේ යෙදිනි. මෙය හඳුන්වන්නේ,

(1) වාණිජ කෘෂිකර්මය ලෙසය. (2) යැපුම් කෘෂිකර්මය ලෙසය.
(3) ග්‍රාමීය කෘෂිකර්මය ලෙසය. (4) සමෝධානික කෘෂිකර්මය ලෙසය.

03 පස සකස් වීමට බලපාන සාධකයක් වන්නේ පහත ඒවායින් කුමක්ද?

(1) පාංශු ජීවීන් (2) උෂ්ණත්වය (3) වර්ෂාපතනය (4) 1,2,3 යන සියල්ලම

04 වැව් බැඳි රාජ්‍යයේ ආරම්භක වැව ලෙස හඳුන්වන්නේ,

(1) මින්නේරිය වැව (2) අභය වැව (3) කලා වැව (4) තෝපා වැව

05 ශ්‍රී ලංකාව දේශගුණික කලාපවලට බෙදා දැක්වීමේ ප්‍රධානතම පදනම වන්නේ,

(1) ආලෝක තීව්‍රතාවයි (2) උෂ්ණත්වයයි
(3) ආර්ද්‍රතාවයයි (4) වාර්ෂික වර්ෂාපතනයයි

06 පස සෑදීමේදී පළමු පියවර පාෂාණ ජීර්ණයයි. පාෂාණ ජීර්ණය කෙරෙහි බලපෑමක් ඇති නොකරන සාධකයක් වනුයේ,

(1) ගලා යන ජලයයි (2) ආලෝකයයි
(3) උෂ්ණත්වයේ වෙනස්වීමයි (4) මිනිස් හා සත්ත්ව ක්‍රියාකාරකම්

07 රතු කහ පොඩ්සොලික් පස දැකිය හැකි ප්‍රදේශය වන්නේ,

(1) කලුතර (2) හම්බන්තොට (3) ගාල්ල (4) කෑගල්ල

08 පසේ ජලය ඇති ආකාර අතරින් ශාකවලට ලබගත හැකි ජලය වන්නේ,

(1) ගුරුත්වා කර්ශන ජලයය. (2) කේශාකර්ෂණ හා ජලාකර්ශන ජලය
(3) කේශාකර්ශන ජලයයි. (4) ජලාකර්ශන ජලයයි.

09 ශ්‍රී ලංකාවට මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර් හා නොවැම්බර් යන මාසවල දී වර්ෂාව ලැබෙන්නේ,

(1) නිරිත දිග මෝසම් වර්ෂාවෙනි. (2) වාසුළි වර්ෂාවෙනි.
(3) ඊසාන දිග මෝසම් වර්ෂාවෙනි. (4) සංවහන වර්ෂාව මගිනි.

10 කොළඹට වඩා නුවරඑළියේ උෂ්ණත්වය සාපේක්ෂව අඩුය. මීට ප්‍රධාන හේතුව නම් ,

(1) ශාක ගහන ව්‍යාප්තියේ වෙනසයි. (2) උෂ්ණත්වයේ වෙනසයි.
(3) මුහුදේ සිට ඇති දුර ප්‍රමාණයයි. (4) අහසේ පවතින වලාකුළු ප්‍රමාණයයි.

11 විශාල වැව් වලින් ජලය බෙදා හැරීමේදී ඇතිවන පීඩනය පාලනය කිරීම සඳහා වූ සුවිශේෂි නිර්මාණය වනුයේ,

(1) පිටවානය (2) රලපනාවය

(3) බිසෝකොටුවය (4) සොරොව්වය

12 ගිනි කඳුවලින් පිටතට එන මැග්මා ඝනීභවනය වීමෙන් සෑදෙන පාෂාණය වන්නේ,

(1) විපරිත පාෂාණයයි. (2) ආග්නේය පාෂාණයයි.

(3) අවසාදිත පාෂාණයයි. (4) මාතෘ පාෂාණයයි.

13 පසක අඩංගු ඛණිජ අතුරින් විෂ්කම්භය මිලි මීටර් 0.2 මි.මි. 0.02 ප්‍රමාණයෙන් යුතු අංශු වර්ගය වන්නේ,

(1) සියුම් වැලිය (2) මැටිය. (3) රළු වැලිය (4) ගල්බොරළුය

14 පසේ ආම්ලිකතාවය අඩු කිරීමට යොදන්නේ,

(1) ගෙන්දගම් ය. (2) ඇමෝනියම් සල්ෆේට් ය.

(3) ඩොලමයිට් ය. (4) යූරියා ය.

15 සොලනේසියේ කුලයට අයත් බෝගයකි.

(1) මුං ඇට (2) මිරිස් (3) වට්ටක්කා (4) බණ්ඩක්කා

16 පතෝල, කරවිල හා වැටකොළු අයත් ශාක කුලය වන්නේ,

(1) පෝඑසියේ (2) පැබේසියේ (3) කුකර්බිටේසියේ (4) සොලනේසියේ

17 පහත දැක්වෙන බෝග අතුරෙන් ධාන්‍ය බෝග පමණක් ඇතුලත් කාණ්ඩය වන්නේ,

(1) වී, ඉදල් ඉරිඟු, බඩ ඉරිඟු, මෙනේරි (2) කුරක්කන්, ඉදල් ඉරිඟු, කව්පි, මුං

(3) බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, සෝයා, කව්පි, (4) කව්පි, කුරක්කන්, බඩ ඉරිඟු, දඹල

18 සුළඟේ වේගය මනින උපකරණය,

(1) P^H මීටරය (2) පානමානය (3) බැරෝමීටරය (4) අනිලමානය

19 පස හොඳින් පෙරලීමේ කාර්යය සඳහා යොදාගත හැකි කෘෂි උපකරණ කාණ්ඩය,

(1) උදැල්ල, රොටමේටරය, කොකු නගුල

(2) උදැල්ල , හැඩ ලෑලි ,නගුල, තැටි නගුල

(3) උදැල්ල , ගැමි ලී නගුල, තැටිපෝරුව

(4) උදැල්ල, සැහැල්ලු යකඩ නගුල , තැටි නගුල

20 නොරිදොකෝ තවාන් (කුට්ටි තවාන්) දැකිය හැක්කේ,

(1) වී වගාවේදී ය. (2) විසිතුරු පැල වගාවේදී ය.

(3) එළවලු වගාවේදී ය. (4) රබර් වගාවේදී ය.

21 ශාකය කුරුවීම හා පත්‍ර විචිත්‍ර වීම ප්‍රධාන වශයෙන් සිදුවන්නේ මින් කවර රෝග කාරකයක් නිසාද?

(1) දිලීර (2) වෛයිරස් (3) බැක්ටීරියා (4) වට පණුවන්

22 බෝග පිහිටුවීමේදී වැටි හා කාණු ක්‍රමය භාවිතා කරනු ලබන බෝග කාණ්ඩය,

(1) බණ්ඩක්කා, මිරිස්, දුම්කොළ (2) රටකජු , බතල , ඉන්නල

(3) රාබු , රතුළුණු , රටකජු (4) කෙසෙල් , බටු, බඩ ඉරිඟු

23 වර්ෂාපතනය දක්වන සම්මත ඒකකය වන්නේ,

(1) සෙන්ටිමීටර්ය. (2) ඩෙසි මීටර් ය. (3) මීටර්ය. (4) මිලි මීටර්ය

24 වසුන් යෙදීමෙන්,

(1) පාංශු සංරක්ෂණය සිදුවේ. (2) ජල සංරක්ෂණය සිදුවේ.

(3) වල් පැලෑටි පාලනය වේ. (4) ඉහත සියළුම ප්‍රයෝජන ලැබේ.

25 පැලෑටි ජන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ,

(1) බතලගොඩය. (2) ලුනුවිල ය. (3) තලවාකැලේ ය. (4) ගන්නෝරුවය.

26 භූගත කඳන් ඇති වල් පැලෑටි අයත් වන්නේ පහත සඳහන් කුමන් වල්පැළෑටි කාණ්ඩයටද?

(1) ඒක වාර්ෂික වල් පැළෑටි. (2) අර්ධ වාර්ෂික වල් පැළෑටි.

(3) ද්වි වාර්ෂික වල් පැළෑටි. (4) බහු වාර්ෂික වල් පැළෑටි.

27 ''දිවි නැගුම '' දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ කුමන වර්ෂයේදී ද?

(1) 2012 (2) 2013 (3) 2014 (4) 2015

28 බෝග වගාවේදී බහුලව හමුවන ව්‍යාධි ජනකයින් අයත් වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයටද?

(1) ඇල්ගී, දිලීර, බැක්ටීරියා (2) වටපණුවන්, බැක්ටීරියා, දිලීර

(3) දිලීර, ගැඩවිලුන්, වටපනුවන් (4) බැක්ටීරියා, වයිරස් , දිලීර

29 පහත ශාක අතරින් අක්‍රමණකාරී වල් පැළෑටියක් ලෙස සැලකෙන්නේ,

(1) හුලංතලා ය. (2) කළාඳුරු ය. (3) කිඹුල්වැන්නය. (4) නිදි කුම්බාය.

30 කොම්පෝස්ට් පොහොර සෑදීමේ දී පැරණි කොම්පෝස්ට් ස්වල්පයක් මිශ්‍ර කරනුයේ,

(1) නිපදවන කොම්පෝස්ට්වල පෝෂණය ඉහළ දැමීමට ය.

(2) ක්ෂුද්‍රජීවීන් හා අවශ්‍ය නයිට්‍රජන් ලබාදීමට ය.

(3) කාබනික් ජීර්ණය සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර ජීවින් හඳුන්වා දීමට ය.

(4) ඉහත පිළිතුරු සියල්ලම වැරදිය.

31 සම්පූර්ණ රූපාන්තරණය පෙන්වන කෘමි කාණ්ඩය වන්නේ,

(1) ඉල්මැස්සා, අවුලකපෝරා, එපිලැක්නා

(2) ඉල්මැස්සා, කීඩෑවා, අවුලකපෝරා

(3) කුඩිත්තා, අවුලකපෝරා, ගොයම් මකුණා

(4) ගොයම් මකුණා, ඉල්මැස්සා, අවුලකපෝරා

32 ජල සම්පාදන ක්‍රම අතුරින් බෝගවල ජල අවශ්‍යතාව ලබාදීමට අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ මින් කවර ජල සම්පාදන ක්‍රමයෙන්ද?

(1) බිංදු ජල සම්පාදනය (2) පිටාර ජල සම්පාදනය

(3) තීරු ජල සම්පාදනය (4) බේසම් ජල සම්පාදනය

33 ලෝක පරිසර දිනය සහ ශ්‍රී ලංකාවේ රුක් රෝපණ දිනය පිළිවෙලින් යෙදී ඇත්තේ කවදා ද?

(1) ඔක්තෝබර් 01 සහ ජූනි 05 ය. (2) ජූනි 05 සහ සැප්තැම්බර් 17 ය.

(3) ඔක්තෝබර් 11 සහ මැයි 01 ය. (4) දෙසැම්බර් 21 සහ ජූනි 05 ය.

34 ඒකාබද්ධ පලිබෝධ පාලනයේදී

(1) පලිබෝධ හානියක් දුටු විගසම රසායනික පළිබෝධ නාශක යොදනු ලැබේ.

(2) පළිබෝධ ආර්ථික හානියක් නොවන මට්ටම තෙක් පාලනය කෙරේ.

(3) පළිබෝධ ගහණය 50% දක්වා අඩු කෙරේ.

(4) කිසිසේත්ම පළිබෝධ නාශක භාවිතා නොකෙරේ.

35 පසක ලවණතාව වර්ධනය වීමට බලපාන්නේ පහත සඳහන් කුමන ක්‍රියාවක්ද?

(1) අඩු වර්ෂාපතනය

(2) අධික වාෂ්පිකරණය

(3) දිගින් දිගටම ලවණ සහිත ජලය පසට යෙදීම.

(4) ඉහත සඳහන් සෑම ක්‍රියාවක් ම වේ.

36 වී ශාඛයේ පත්‍රය කඳට සම්බන්ධ වන්නේ,

(1) පත්‍ර තලය මගිනි. (2) පත්‍ර කොපුව මගිනි.

(3) ජිහ්වලය මගිනි. (4) කර්ණිකා මගිනි.

37 ශ්‍රී ලංකාවේ වගාකරනු ලබන පාරම්පරික වී ප්‍රභේදයකි.

(1) Bg 300 (2) Bw 351

(3) පච්ච පෙරුමාල් (4) P.T.B. 16

38 මාස 3½ වයස රතු සහල් වර්ගයකි. කොළ පාළු රෝගයට යකඩ විෂ වීමට හා කොපු අංගමාරයට ඔරොත්තු දෙන වී ප්‍රභේදකයකි. එය,

(1) Bw 351 (2) Bg 450 (3) Bg 300 (4) Bg 3-5

39 වී අභිජනන මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ,

(1) තලවා කැලේ (2) බතලගොඩ (3) ලුණුවිල (4) අගලවත්ත

40 වී වගාවේ පත්‍ර හා කිරිවදින බීජවල යුෂ උරා බීම සිදු කරනුයේ,

(1) පුරුක්පණුවා (2) ගොක් මැස්සා (3) ගොයම් මකුණා (4) ගොඩවෙල්ලා

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අවසාන වාර පරීක්ෂණය 2015

කෘෂි හා ආහාර තාක්ෂණය II

10 ශ්‍රේණිය **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 04 කටත් පමණක් පිළිතුරු සපයන්න.**

01 විවිධ ලක්ෂණ පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ පස කාණ්ඩ 14 කට බෙදා ඇත. ශ්‍රී ලංකාවේ බහුලව පස් කාණ්ඩ තුනක් ඇත

(1) පහත ප්‍රදේශවල ඇති පස් වර්ග මොනවාද?

වියළි කලාපය ගංගා ආශ්‍රිතව

(2) පාංශු හායනයට හේතු 2ක් ලියන්න.

(3) පස තද බව නිසා ඇතිවන අහිතකර බලපෑම් 2 ක් ලියන්න.

(4) පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් 2 ක් ලියන්න.

(5) පාංශු ඛාදනය සිදුවන ආකාර 2 ක් ලියන්න.

(6) පාංශු පුනරුත්ථාපනය යනු කුමක්ද?

(7) පාංශු ඛාදනය අවම කරන ක්‍රම 2 ක් ලියන්න.

(8) කෘෂි කාර්මික බෝග වර්ගීකරණ නිර්ණායක 2 ක් ලියන්න.

(9) මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර 2 ක් ලියන්න.

(10) බෝග වගාවේදී බෝග වර්ගීකරණය වැදගත්වන අවස්ථා 2 ක් ලියන්න. $(2 \times 10 = 20)$

02 ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය තුළ කුඹුරු, ගෙවතු සහ හේන් වගා සහිත වූ සාර්ථක කෘෂිකර්මාන්තයක් පැවතිණි. එදවස රට සහලින් සහ අනෙකුත් ආහාරවලින් ද ස්වයංපෝෂිතව පැවතුණි.

(1) වැවක ප්‍රධාන කොටස් 3 ක් ලියන්න. (ල. 03)

(2) බහුකාර්ය යෝජනා ක්‍රම 3 ක් ලියන්න. (ල. 03)

(3) හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් 2 ක් ලියන්න. (ල. 02)

(4) ආහාර සුරක්ෂිතතාවයට බලපාන සාධක 2 ක් ලියන්න. (ල. 02)

03 යම්කිසි ප්‍රදේශයකට ගැලපෙන බෝග තෝරාගැනීමටත්, බෝග අස්වනු වැඩිකර ගැනීමටත්, අහිතකර කාලගුණ තත්ත්ව නිසා සිදුවන බෝග පාළුවීම අවම කර ගැනීමටත් එම ප්‍රදේශයේ දේශගුණය හා කාලගුණික පාරමිතික පිළිබඳව දැන සිටීම වැදගත් වේ.

(1) බෝග වගාවේදී වැදගත් දේශගුණික සාධක 3 ක් ලියන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම 3 ක් ලියන්න. (ල. 03)

(3) බෝග වගාවට බලපාන උෂ්ණත්වයේ අහිතකර බලපෑම් 2ක් මොනවාද? (ල. 02)

(4) මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව ප්‍රධාන දේශගුණික කලාප උප කලාපවලට වෙන්කර ඇත. එම දේශගුණික කලාප දෙකක් ලියන්න. (ල. 02)

04 පසක් නිර්මාණය වන්නේ පාෂාණවලිනි. පාෂාණ ජීර්ණය මගින් පාංශු මාතෘ ද්‍රව්‍ය නිර්මාණය වේ.

(1) පාෂාණ හා ඒවායේ සම්භවය අනුව වර්ග 3 කට නම් කරන්න. (ල. 03)

(2) භෞතික ජීරණයට බලපාන සාධක 3 ක් ලියන්න. (ල. 03)

(3) පාංශු ජලය පවතින ආකාර 3ක් ලියන්න .(ල. 03)

(4) පාංශු ජීවීන් කෙටියෙන් හඳුන්වන්න. (ල. 01)

05 බොහෝ බෝග වර්ග වගා කිරීමේදී බීජ හෝ වර්ධක කොටස් තවාන් කර ලබාගන්නා පැළ ක්ෂේත්‍රයේ සිටුවන අතර සමහර බෝගවල බීජ එක්වරම ක්ෂේත්‍රයේ සිටවනු ලැබේ.

(1) තවාන් වර්ග 3 ක් ලියන්න. (ල. 03)

(2) තවානකට සුදුසු ස්ථානයක් තේරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(3) තවාන් මිශ්‍රණයේ අඩංගු ද්‍රව්‍ය හා එහි අනුපාතය ලියන්න. (ල. 03)

(4) තවාන් ජීවාණුහරණය කරන ක්‍රම 2 ක් ලියන්න. (ල. 01)

06 වර්තමානයේ ජලය සීමිත සම්පතක් වන බැවින් එය මතු පරපුර වෙනුවෙන් මනාව කළමනාකරණය කළ යුතු වන අතර අතීතයේ ද ජල කළමනාකරණය කෙරෙහි ඉහළ අවධානයක් තිබූ බවට සාක්ෂි ඇත.

(1) බෝගවලට ජල සම්පාදනයේදී සැලකිය යුතු කරුණු 3ක් ලියන්න. (ල. 03)

(2) උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම 2 ක් ලියන්න. (ල. 02)

(3) ජල වහනයේ වාසි 2ක් ලියන්න. (ල. 02)

(4) ජලවහන කාණු රටා 3 ක් ඇඳ පෙන්වන්න. (ල. 03)

07 ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වූ බත සපයනු ලබන්නේ වී ශාකයෙනි.

(1) වී වගාව ශ්‍රී ලංකාවට වැදගත් වන කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(2) ගොයම් පැළෑටියේ වර්ධන අවධි 3 ක් ලියන්න. (ල. 03)

(3) වැඩි දියුණු කළ වී ප්‍රභේද අභිජනනයේදී සලකා බලන මූලික කරුණු 4ක් ලියන්න. (ල. 04)